01

Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities
2015, Vol. 4 (I) 1-10pp
© The Author 2015
Ed. *Tissa Weerasekara*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# සංදේශ කාව්‍යය තුළින් නිරූපිත නාථ දෙවියන්ගේ ස්වභාවය හඳුනාගැනීම

ආචාර්ය අජිත් තල්වත්ත[1]

## Abstract

Even after introducing Buddhism to Sri Lanka by Arahath Mihindu, the faith in god and other beliefs have not totally vanished from the society. The positioning of concept of god in the Sinhala Buddhist belief system do not recognized the mentioned in Tripitaka. These faiths have entered to the concept of Sinhala gods either from Mahayana, Hindu ideology or common faith of people. The concept of worshipping gods has spread out due to the influence of South Indian invasions and those beliefs got establish during the Polonnaruwa period. Inter marriages between the Sinhala and Tamil royal families and South Indian invasions were another firm reason to establish these beliefs in Sri Lanka. Furthermore, the worship of Hindu gods was explicitly incorporated into the temples since the Gampola period. It is believed that especially in Mahayana Buddhism there are many Bodhisattva gods. As a result of evolution of bodhisattva concept god Natha or Avalokitheshwara was significant in medieval Sri Lanka. The concept of god Natha became prominence after the Gampola period and was given special recognition even within Sandesha Kavya tradition in Sri Lanka. The prominence of god Natha reached its peak during the Kotte era which is considered the golden period of Sandesha Kavya. A cursory look at the Sandesha Kavya of Kotte period gives ample evidence towards this claim.

**Key Words:** *Avalokitheshwara, Bodhisattva gods, Gampola period, Mahayana,*

[1] *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීයවිද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ*

## හැඳින්වීම

මිහිඳු මහරහතන් වහන්සේ ශ්‍රී ලංකාවට බුදුදහම හඳුන්වා දීමෙන් පසුව වුව ද පැවති දෙවිදේවතා හා වෙනත් විශ්වාස සහමුලින් සමාජය අත්හැර ගිය බවක් නොපෙනේ. සිංහල බෞද්ධ විශ්වාස පද්ධතිය තුළ දේව විස්වාස කේන්ද්‍රගත වන්නේ ත්‍රිපිටකයෙහි දක්නට ලැබෙන දෙවිවරුන්ට නොවේ. පොදු ජන විශ්වාසවලට අයත් වීම හෝ මහායාන හෝ හින්දු දේව මණ්ඩලවලින් සිංහල දේව මණ්ඩලයට පිවිසුණු අය වෙති. වරින් වර ලංකාවට එල්ල වූ දකුණු ඉන්දියානු ආක්‍රමණ සමහර දේව ඇදහිලි සිංහලයන් අතර ප්‍රචාරය වීමට හේතු වූ අතර පොළොන්නරු යුගයේ පටන් එම ඇදහිලි මෙරට මුල් බැස ගනු දක්නට ලැබේ. දකුණු ඉන්දියානු ආක්‍රමණ මෙන්ම සිංහල සහ දෙමළ රජ පවුල් අතර සිදු වූ විවාහ ද මෙරට දේව මණ්ඩලයට වැද්ද ගෙන මුල් බැස ගැනීමට අවස්ථාවක් ලැබුණි. තවද හින්දු දෙවිවරුන්ට බෞද්ධ විහාර මන්දිර තුළට පිවිස නවාතැන් ගැනීමට අවස්ථාවක් ලැබෙන්නේ ගම්පොල යුගයේ සිට ය. විශේෂයෙන් ම මහායානය තුළ මහත් සම්භාවනාවට ලක්වූ බෝධිසත්වරු දෙවිවරුන් වූහ. බෝධිසත්ව සංකල්පය ක්‍රමික ව විකාශනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මධ්‍යකාලීන ලංකාවේ අවලෝකිතේශ්වර නොහොත් නාථ දෙවියන්ට හිමි වූයේ සුවිශේෂී ස්ථානයකි. ගම්පොල යුගයෙන් පසු නාථ දෙවියන් ජනප්‍රිය වී සංදේශ කාව්‍ය තුළ උන්වහන්සේ විශේෂ ඇගයීමකට ලක්කර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සංදේශ කාව්‍ය මගින් නිරූපිත නාථ දෙවියන්ගේ ස්වභාවය හඳුනාගැනීම සඳහා ය.

## පර්යේෂණ ගැටලුව

සංදේශ කාව්‍ය තුළින් නිරූපිත නාථ දෙවිඳුන් යන පර්යේෂණයේ ප්‍රධාන පර්යේෂණ ගැටළුව පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය. ගම්පොළ සහ කෝට්ටේ යුගයේ රචනාවූ සංදේශ කාව්‍ය තුළ නාථ දෙවියන් වෙත ලබාදී ඇති ස්ථානය පිළිබඳ පූර්ණ අවබෝධයක් ලබාගැනීමට අපෙක්ෂිත ය.

## පර්යේෂණ ක්‍රමවේදය

සංදේශ කාව්‍යය තුළින් නිරූපිත නාථ දෙවියන්ගේ ස්වභාවය හඳුනාගැනීම යන ශාස්ත්‍රීය පර්යේෂණය සිදුකිරීමේ දී තොරතුරු ලබාගැනීම පිණිස අනුගමනය කරන පර්යේෂණ ක්‍රම වේදය හා මූලාශ්‍ර ද ඉතා වැදගත් වේ. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමේ දී පුස්තකාල හා ජාතික ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන ද යොදා ගැනීමට ද අපේක්ෂිත ය. තොරතුරු ලබාගැනීමේ දී ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර යොදාගැනීමට අවධානය යොමු කෙරේ.

## විමර්ශනය

බෞද්ධ ජන සමාජයෙහි නිබඳ ව ගෞරවාදරයට ලක්වන දෙවියකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයට අනුව, නිර්වාණය මගින් සසර ගමන කෙළවර වී අවසාන විමුක්තිය ලද හැකි වුවත්, දෙවියන් සරණ යෑම එතරම් ම දුරට පිළිගන්නේ නැති බවක් පෙනේ. එනමුත් කාලානුරූප ව සිදු වූ වෙනස්වීම් තුළ බෞද්ධ චරියාවන් තුළ දෙවියන් සම්බන්ධ ක්‍රියා පිළිවෙත් සම්මිශ්‍ර වී ඇත. බෞද්ධ සංකල්පය හා දේව සංකල්පය එකිනෙකට බද්ධ වීම පොළොන්නරු යුගයෙන් පසු සෘජු වශයෙන් සිදුවිය. එලෙස මුසු වී ජනතා ගෞරවාදරයට පත් දෙවි කෙනකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය (ධර්මදාස සහ තුන්දෙණිය, 1994:76). මෙරට ඉතිහාසයේ නාථ දෙවියන් වඩාත්, වැදගත් වන්නේ බෝධිසත්ව තත්ත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත්වීම නිසාය. මුල දී අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෙස පුද පූජා ලැබූ මෙම දෙවියන් පසුකාලීනව බෝධිත්ත්ව තත්ත්වයෙන් මිදී දේවත්වය ආරෝපණය කරගන්නා ආකාරය දක්නට ලැබේ (පරණවිතාන, 1994:189). එලෙස නාථ දෙවියන් බවට පත්වීමට උප්පත්තිය කෙබඳු ලෙසින් සිදු වුවාද යන්න හඳුනාගැනීම ඉතා වැදගත් වේ.

පොළොන්නරු යුගයෙන් පසුව එනම් 14 වන සියවස සිංහල ඉතිහාසයේ දේශපාලන හා ආර්ථිකයේ පසුගාමී යුගයකි (හේරත්, 2003:204). පුලස්තිපුරය දහතුන් වන සියවස අග භාගයේ දී අතහැර දමා ආරක්ෂා උපායක් වශයෙන් නිරිතදිගට සංක්‍රමණය වීම ඇරඹුණි. නමුත් අනුරාධපුර යුගයේ සිටම ජනප්‍රිය ව පැවති මහායාන බෝධිසත්ව සංකල්පය 14 වන සියවස වන තෙක්ම සිංහල සමාජ, දේශපාලන ව්‍යුහයක් තුළට සුවිශේෂී වූ බව නොපෙනේ. මෙම බෝධිසත්වයන් දේශීය බවට පත්වීම සිදුව ඇත්තේ ගම්පොල යුගයේ දී වන අතර එතැන් සිට අවලෝකිතේශ්වර ස්වීයත්වය හා අනන්‍යතාව ද සැකසීමට භාජනය විය (හෝල්ට්, 1994:137). අවලෝකිතේශ්වර නාථ නමින් ආරම්භ වී ඇත්තේ 14 වන සියවසේ ගම්පොල යුගයේ දී බවට සාධක ඇත. ඔහුගේ තවත් අභිදානයක් වන "ලෝකේශ්වර නාථ" යන්නෙහි කෙටි නම වන නාථ යන නමිනි. මෙම හැඳින්වීම නිසා බෝධිසත්වයන්ගේ අතීතය මුළුමනින් ම මැකී ගියද උඩරට රාජධානියේ දේශපාලන උරුමය තහවුරුවට සම්බන්ධ වී ලෞකික දෙවියකු බවට පත් විය.

බෝධිසත්ත්ව වන්දනය හා බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම ගම්පොල යුගයේ ශිලා ලේඛනවල සහ සාහිත්‍ය මූලාශ්‍රවල ද දක්නට ලැබේ. මෙම යුගයේ විහාරස්ථානවල දේව රූප සමඟ ම බෝධිසත්ව රූප ද කරවා ඇත. ජාතක පොතේ ඇති කථා ගම්පොල යුගයේ විහාරවල සිතුවම් කරන ලදී (*EZ*.1948:90-100). ගඩලාදෙණි ලිපියේ නාථ සහ මෛත්‍රී දෙදෙනා ගැන දැක්වේ. නාථ යනු මෙම දෙවියන්ගේ දකුණු ඉන්දියානු නාමය බවට මහාචාර්ය මංගල ඉලංගසිංහ විසින් පෙන්වා දෙනු ලැබේ (ඉලංගසිංහ, 2005:270-280). මෙම බෝධිසත්වවරුන් පොදුවේ දෙවියන් අතර දක්වා ඇතත්

බෝධිසත්වවරුන් ලෙස ඔවුන්ට හිමි වූ ස්ථානය මෙම අවධියේ වෙනත් මූලාශ්‍රවල ද දැකගත හැකිය. ලංකාතිලක සිංහල ලිපියේ මෛත්‍රී බෝධිසත්ත්ව නමින් ද නාථ ලෝකේශ්වර නාථ නමින් ද හඳුන්වා ඇත. මින් අවබෝධ වන්නේ සෙසු දෙවියන්ට වඩා නාථ දෙවිඳුන්ට විශේෂත්වයක් මෙම යුගයේ දී හිමි වූ බවයි.

නියම්ගම්පාය ලිපියට අනුව එම විහාරයේ උඩු වියනේ මෛත්‍රී බෝසතුන්ගේ රුව සිතුවමට නැගූ බව පෙනේ. සෙංකඩගල දෙවියන් විසින් අලකේශ්වර සහ දේවමන්ත්‍රීශ්වර දෙදෙනාට සිහිනෙන් පෙනී සිට සතුරන් පරාජය කිරීම පිණිස ජය කාරණා දක්වන ලද බවට සගම ලිපිය සාක්ෂි දරයි (*EZ*.1948:296-311). නාථ බෝධිසත්වයකුට වඩා ලංකාරක්ෂක දෙවියකු ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ. නාථ දෙවියන් සම්බන්ධයෙන් ආචාර්ය ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් දක්වන අදහස ඉතා වැදගත් වේ. "නාථ සහ මෙරට රාජත්වය අතර සුවිශේෂී සබඳතාවන් පැවති බවත් මෙරට පාලකයන් බෝධිසත්ව යානය අනුගමනය කළ බවත්, ඒ අනුව බෝධිසත්ව, දේව, රජ යන සංකල්පයක් පැවති බවත්, ඒ නිසා නාථ සිංහල රාජ්‍යයේ ආරක්ෂකයා බවත් පවසයි (හෝල්ට්, 1994:137). එසේ ම අම්පිටිය ලිපියේ (*EZ*.1948:271-273) දැක්වෙන "සෙංකඩගල දෙවියන්" යනු ද මෙම නාථ දෙවියන්ම බව ඔහුගේ අදහසයි. මේ වනවිට නාථ කෘත්‍යමය වශයෙන් දෙවියකු බවට පත් වී සිටි බව ද, සත්ත්වයන් සසරින් එතර කිරීමේ බෝධිසත්ත්ව ගුණය වෙනුවට බැතිමතුන් ආරක්ෂා කරන ලෞකික කාර්යයන් ඉටු කළ දෙවියකු බවට පත් වූ බව ද හෝල්ට් වැඩිදුරටත් පෙන්වා දේ.

තිරස සංදේශයේ ද නාථ දෙවියන් "නතිඳු" නමින් ද එතුමන්ගේ දේවිය තාරා බිසව නමින් ද හඳුන්වයි. එහි දී දොරවක තිබූ නාථ දේවාලයත් නාථ දෙවිඳුන් හා තාරා බිසවත් නමදින ලෙස තිසරාට විධාන කර තිබේ. ආචාර්ය ජෝන් හෝල්ට් පවසන්නේ බුදුමැදුර තුළ නාථ දේව ප්‍රතිමාවක් පැවති බවකි (හෝල්ට්, 1994:152). මෙසේ නාථ බෝධිසත්වරයකු ලෙස සලකන නිසා එසේ තබන්නට ඇත. බුදු බව ප්‍රාර්ථනා කිරීම ද මෙකල බහුල ව සිදු වූ බව ඉහත තොරතුරු මගින් අනාවරණය වේ. ඊට අමතර ව මහායාන සංකල්පය කෙරෙහි විශේෂ නැඹුරුවක් පැවති බව පෙනේ. සද්ධර්මලංකාරයේ "බාහිර සිදාසියේ දී ව්‍යාඝ්‍ර ජාතක කාව ඇත (සෝමානන්ද, 1953:795). මෙම කථා හුදෙක් ස්වර්ණ ප්‍රභාස, අවදාන කල්පලතා වැනි මහායාන ග්‍රන්ථවල ආර්යශූරපාදයන්ගේ ජාතක මාලාවේ ද දක්නට ලැබේ (එම). සද්ධර්මලංකාරය කෝට්ටේ යුගයේ දී රචනා කළත් එමගින් නිරූපණය වන්නේ ගම්පොල යුගයේ පැවති තත්ත්වය බවට මහාචාර්ය චන්දන අබයරත්න පෙන්වා දේ. කෙසේ නමුත් ඉහත තොරතුරු තුළින් පැහැදිලි වන්නේ ගම්පොල යුගයේ පැවතියේ ථෙරවාදී ආගමික පසුබිමක් නොව මහායාන හා හින්දු දේව විශ්වාස සම්මිශ්‍රණය වූ ආගමික පසුබිමක් බවයි.

ගම්පොල යුගයේ දී නාථ දේව වන්දනය ජනප්‍රිය වී වැදගත්කමින් වැඩිවන අයුරු පෙනේ. එසේ වීමට කුමන හේතු ඉවහල් වූවා ද යන්න පිරික්සිය යුතුය. දිගුකාලීන වශයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ස්ථාවරත්වයක් නොමැති වූ විට සිදුවන විපරිවර්තනයන අතිමහත් ය. ගම්පොල යුගයේ දී මෙම තත්ත්වය වඩාත් හොඳින් නිරූපණය වන අතර ඇතැම් විට විදේශීය රාජ්‍යයන් සමඟ ද සබඳතා වැඩිකර ගැනීමට උත්සහ ගනී. විශේෂයෙන් ම ධර්මකීර්ති මාහිමියන් සහ සේනා ලංකාධිකාරයන් දකුණු ඉන්දියාවේ ආගමික කටයුතුවල නිරත වීමත්, ඒ සම්බන්ධතා මත දකුණු ඉන්දියානු ශිල්පීන් මෙරට විහාර කර්මාන්ත සඳහා ගෙන්වා ගැනීමත්, මේ සම්බන්ධතාවලට ප්‍රකට නිදසුන් ය. දේව විශ්වාසය හා හින්දු ආගමික බලපෑම් මෙරට සංස්කෘතියට සහ බුදුදහමට තර්ජනාත්මක තත්ත්වයකට පත් නොවී, සහජීවන තත්ත්වය නිතර පැවති බවත් ආගමික සම්මිශ්‍රණයක් ඇති කිරීමට දායක වූ බවත් පෙනේ. පොළොන්නරුවේ බලයට පත් පළමුවන විජයබාහුගේ සිට දකුණු ඉන්දියානු රජ පවුල සමඟ පැවැත් වූ සම්බන්ධතා සැලකිය හැකි ය. මෙම සබඳතා මෙරට සමාජයේ බහු ආගමික සංස්කෘතියක් බිහිවීමේ ප්‍රතිඵලයක් ලෙස අවලෝකිතේශ්වර නාථ සංකල්පය බිහිවීම ද සිදුවන්නට ඇතැයි සිතිය හැකි ය. ඉහත සාකච්ඡා කළ සමස්ත කරුණු ඇසුරෙන් අපට අවබෝධ වන්නේ 7 වන සියවසේ සිට 10 වන සියවස දක්වා බෞද්ධ බෝධිසත්වයකු ලෙස පූජත්වයට පත් වූ අවලෝකිතේශ්වර ගම්පොල යුගය වන විට එම තත්ත්වයෙන් මිදී දෙවියකු ලෙස නැවත පුද පූජාවලට ලක්වන බවකි.

නාථ දෙවිඳුන් පිළිබඳ ව කරුණු අධ්‍යයනය කිරීමේ දී ශිලා ලිපි පමණක් නොව ගම්පොල හා කෝට්ටේ යුගයේ දී රචිත සංදේශ කාව්‍ය ද ඉතා වැදගත් වේ. නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීම පිණිස සංදේශයක් යැවීමේ දී නිබඳ වර්ණනාවට නාථ දෙවියෝ ලක්වූහ. ඒවායේ අන්තර්ගත පද්‍ය මගින් සමකාලීන නාථ දෙවිඳුන්ගේ, වැදගත්කම හා ඓතිහාසික තොරතුරු රැසක් ලබා ගැනීමට හැකිවීම කැපී පෙනේ.

මෙරට සංදේශ කාව්‍ය ගම්පොල යුගයෙන් ආරම්භ වේ. ගම්පොල සාහිත්‍ය යුගය අර්ධ ශතවර්ෂයක් පමණ සුළු කාලයකට සිමා වූ නමුදු විශේෂ ලක්ෂණ කිහිපයක් නිසා වැදගත් තැනක් ගත්තේය. සංදේශ කාව්‍ය සිංහල සාහිත්‍ය වංශයේ උසස් තැනක් ගන්නා අංගයකි. උසස් සංදේශ දෙකක් ම රසික ලෝකයාට උරුම කර දීමේ භාග්‍යය ගම්පොල යුගයට ලැබුණේ ය (ධීරානන්ද, 2005:154). තිසර සංදේශයත්, මයුර සංදේශයත් ඉතා වැදගත් වේ. රචිත සංදේශ සාහිත්‍යයෙන් නාථ දෙවියන් වරම් දෙවියකු වශයෙන් පමණක් නොව, තුති පුදට ලක්වූ ජාතික දෙවියකු වශයෙන් ද හඳුන්වා ඇත.

සංදේශ කාව්‍යවල ප්‍රධාන අරමුණ වන්නේ දෙවියන්ගේ පිහිට හා ආරක්ෂාව පතා විවිධ පක්ෂින් මගින් අදාළ දෙවොල සඳහා පණිවුඩ යැවීමය. එකී සංදේශ තුළ අපේක්ෂිත පරමාර්ථ අතර ලෞකික සහ ලෝකෝත්තර අපේක්ෂා කැපී පෙනේ. තිසර සංදේශයෙහි අවලෝකිතේශ්වරගේ බිරිඳ වූ තාරා දේවිය ගැනත්

නාථ දෙවිඳුන් පිළිබඳවත් තොරතුරු අන්තර්ගත ය (ධර්මදාස, 2005:94). තිසර සංදේශයෙහි ඔවුන් ගැන මෙසේ සඳහන් වේ. "විදුලිය ලැගි මේ කුළක් වැනි රන් ඉද්දෙන් බැබළෙන ජටා මකුටය බැබළෙන පහනකට ළං වූ ඉඳුනිල් මිණක් පරදයි. ඇත් සොඬ වැනි අත් යුවළ පණ්ඩර පර්වතය දෙපසින් ඇද හැළෙන දිය ඇළි දෙකක් මෙනි. අමා පිඩක් වැනි ගතෙහි එල්බෙන අරක්ෂා මාලාව අහස් ගඟෙහි සුනිල් හංස පෙළක් මෙනි. රැස් විහිදෙන නිය පෙළින් යුත් පාදය පැතුරුණු තාරකාවලියක් සහිත සැදෑ වලා පෙළක් මෙන් බැබළිණි. එසේම සඳ රැසින් හැකිළෙන පිනි රැඳුණු නෙළුම් මල්හි මානය දුරු කළේය. එසේ සුන්දර රූ සිරින් යුත් නාථ දේවේන්ද්‍රයෝ ඒ බුදු මැඳුර තුළට වැජඹෙති (මුනිදාස, 1936:130).

පදනි යෙනි රසඳුළ වනළ තුරුවැළ සඳබ පබ ළේ
සඳරු සිනි ඇකිළෙන තුසර රැඳි තබර මන් පහළේ
සොඳ රුවනි යුතු ඉනි නතිඳු එම මුනි නිවස බැබළේ
වැද නොයනි ඔහුදු අයදු කුළු දෙන ලෙස මන දොළේ (එම)

ඉහත තොරතුරු තුළින් තිසර සංදේශකරුවාගේ ජනාදරයට බඳුන් වන නාථ දෙවිඳුන්ගේ ස්වභාවය මනාව අවබෝධ වේ. මෙම විස්තරය තුළින් පැහැදිලි වන්නේ දොරවක පැවති නාථ දේවාලය වුවත් දැනට මෙය දක්නට නොලැබේ. එය සපුමල් කුමරු විසින් කරවනු ලැබූ දේවාලය බව විශ්වාස කළ හැකිය (හෝල්ට්, 1994:152). එනමුත් මෙම කරුණු තුළින් අපට ගම්‍ය වන්නේ ගම්පොල යුගය වන විට නාථ දෙවියන් පිළිබඳ ආගමික සංකල්පයක් පැවති බවයි. මෙම අවධියේ දී අවලෝකිතේශ්වර නාථ හා තාරා කාව්‍යමය වශයෙන් සිංහල දේවතාවන්ගේ තත්ත්වයට පත් වූ බව තිසර සංදේශයෙන් පැහැදිලි වේ. එමගින් නාථ දෙවිඳුන් වර්ණනාවට බඳුන්ව ඇත්තේ සිතුම් පැතුම් ඉටුකර දෙන දෙවියකු විලසිනි. තවද නාථ දෙවියන් වෙතින් සත්ත්වයන් සසරින් එතෙර කිරීමේ බෝධිසත්ව ගුණය ක්‍රමික ව ඉවත් ව තිබූ බව පෙනේ.

නාථ දෙවිඳුන් මේ අයුරින් සමාජ පිළිගැනීමට කෙසේ ලක් වූයේ ද යන්න විමසා බැලිය යුතුය. සියවස් ගණනාවකට පෙර සිට ම පැවති අවලොකිතේශ්වර සංකල්පය හා ලෝකේශ්වර නාථ සංකල්පය හා එකට මුසුවී ලාංකීය දේශපාලන හර පද්ධතිය හා එකතු වීම ගම්පොළ යුගය තුළ සිදුවිය. ඉහත සාකච්ඡා කරන ලද සගම ලිපිය මගින් ද එය තහවුරු වේ. තිසර කතුවරයා විසින් ප්‍රධාන වශයෙන් අවධාරණය කරනු ලබන නාථ දෙවිඳුන්ගේ ආධ්‍යාත්මික තොරතුරු ඉතා වැදගත් වේ. "සංසාර සාගරයෙන් සියලු සත්වයා එතර කරන්නා වූ, නිර්වාණය සෑම දෙනාට ම ඉලක්ක කර දෙන්නා වූ, බෝධිසත්ව අදහස් මස්තක ප්‍රාප්ත කරන්නා වූ, නාථ දෙවිඳුන් ඇස් ඇර බලන්න" යනුවෙන් නාථ දෙවිඳුන් වර්ණනා කර තිබේ. මෙම තොරතුරු තුළින් සනාථ වන්නේ නාථ දෙවියන් ලෞකික තත්ත්වයට වඩා ආධ්‍යාත්මික ස්වරූපයක් ගන්නා බවයි. දේශපාලන බලය බෙදාගත් අය නාථ දෙවියන්ගේ ලෞකික බලයෙන් ප්‍රයෝජන ගත්ත ද දෙවියන්ගේ ලෝකෝත්තර බලය සම්පූර්ණයෙන් ම අතුරුදහන් වූයේ නැත. ඊට හේතුව වූයේ කෝට්ටේ

යුගයේ දී උන්වහන්සේගේ ලෝකෝත්තර බලය යළි වර්ණනාවට භාජනය වීමයි. එනමුත් මහනුවර යුගයේ දී මෙම දෙවියන්ගේ ලෝකෝත්තර බලය එතරම් ඇගයීමට ලක් නොවේ. නමුත් වර්තමානයේ දී නාථ දෙවිඳු මතු බුදු වන මෛත්‍රී බුදුන් හා සම්බන්ධ කිරීම තුළින් ලෝකෝත්තර නිර්වාණය ලබා දෙන්නෙකු ලෙස සිංහලයන් විසින් අදහනු ලැබේ.

හයවෙනි පැරකුම් රාජ්‍ය සමයේ ඇතිවූ දේශපාලනික, ආර්ථික හා සමාජ ස්ථාවරත්වය තුළින් ශාස්ත්‍රීය ප්‍රබෝධයක් ඇති වීම කැපී පෙනේ. සිංහල සංදේශ සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වශයෙන් කෝට්ටේ රාජධානි සමය සඳහන් කළ හැකිය. මෙම යුගයේ රචිත ගිරා, කෝකිල හා මයූර සංදේශවල නාථ දෙවියන් පිළිබඳ ව තොරතුරු රැසක් දක්නට ලැබේ. කෝට්ටේ යුගයේ මුල් කාලය වන විට නාථ ඇදහීම නිරිතදිග, පහතරට ප්‍රදේශයන්හි සිංහල බෞද්ධ සංස්කෘතිය තුළ ද පැතිර ගොස් තිබූ බව පෙනේ. සිංහල සාහිත්‍යයේ මේ දෙවියන් ගැන කර ඇති සඳහන් සියල්ල ම පාහේ කෝට්ටේ හය වෙනි පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ සිට ඇරඹේ (පරණවිතාන, 1994:188). එකල කවියකු ද ව්‍යාකරණ විශාදරයකු වූ ද ශ්‍රී රාහුල මාහිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවති තොටගමුව මේ ඇදහිල්ලේ ප්‍රධාන ස්ථානය විය(එම).

ශ්‍රී රාහුල හිමියන් සඳහන් කරන අන්දමට නාථ වන්දනාව බෙහෙවින් ප්‍රචලිත වූයේ සංසාරයෙහි සැරිසරන සත්වයන් සසරින් ගොඩලෑමට සමත් අයෙකු බව පිළිගත් හෙයිනි. සංදේශ කෘති රාශියක ම විශේෂයෙන් ම ශ්‍රී රාහුල හිමියන්ගේ කෘතිවල නාථ ඉෂ්ටඵලදායි කාරුණික බෝධිසත්වයකු ලෙස හඳුන්වමින් නාථගේ අනුග්‍රහය රජතුමාට ලැබීම සඳහා ආයාචනා කළ බව දැක්වේ (හේරත්, 2003:210). මෙලෙස මෙතෙක් ලියවුණ සංදේශ අතරින් නාථ දෙවියන්ගේ ආරක්ෂාව, බලය හා රාජත්වය පිළිබඳ ව උනන්දුව ගැන සඳහන් වන එක ම සංදේශය ගිරාව පමණක් වුවද මෙම සෑම සංදේශයකින් ම දේව වන්දනයත් හය වන පරාක්‍රමබාහු රජු සහ ඔහුගේ රජ පවුල ආරක්ෂා කර ගැනීම සඳහා දෙවිවරුන් සම්බන්ධ කර ගැනීමත් දක්නට ලැබේ.

ශ්‍රී රාහුල හිමියන් සහ ඔහුගේ ගෝල පිරිස නාථ දෙවියන් විමුක්ති දායක දෙවි කෙනෙකු ලෙස සැලකූ බව පෙනේ. ගිරා සංදේශයෙහි ප්‍රධාන ස්ථානය හිමි වන්නේ නාථ දෙවියන්ට ය. එහි අරමුණ වී ඇත්තේ තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ලවා නාථ දෙවියන්ට ආයාචනා කරවා හයවෙනි පැරකුම් රජුටත් ශ්‍රී ලංකා බුද්ධ ශාසනයටත් ආරක්ෂාව සහ සෞභාග්‍යය ලබාදීමයි (පියරතන, 1948:230). බුද්ධ ශාසනය දීර්ඝ කාලයක් රැකීමේ කාර්ය අවලෝකිතේශ්වර නාථට පවරා ඇති බව මෙම සංදේශයෙන් තහවුරු වේ. නාථ දෙවිඳුන්ට හිමි වූ තත්ත්වය පහත පදයෙන් තහවුරු වේ.

මහන සසර සයුරෙහි කමුටුවැ සරණ
අනත ගන නිවන්පුර ගෙනයන අටිණ
සනත සොඳුරු බුදුකුරු ගුණ දම් පුරණ
දියත පසිඳු නතිඳුන් දැක ගොස් සොබණ (එම)

ඉහත පද්‍යයෙන් නාථ දෙවිඳුන් මැනවින් නිරූපණය වේ. මෙහි දී නාථ මහා කාරුණික නෙත් සඟලකින් හෙබි අයෙකු ලෙස දක්වා ඇත. සියලු සතුන්ගේ, ලෙඩ රෝග, භූත දෝෂ දුරු කොට රජුත්, රටත් ආරක්ෂා කොට සෞභාග්‍ය උදා කර දෙන ලෙස පණිවුඩය මගින් ඉල්ලා ඇති බව පෙනේ. කවියා පවසන අයුරු එබඳු සත්කාරයක් මගින් නාථ දෙවිඳුන්ගේ කීර්ති කදම්බය ලොව පුරා පැතිර යයි (එම, පද්‍ය.11). මෙහිදී පෙන්වා දිය යුතු වැදගත් ම කරුණ නම් වංශකථාව හා පාරම්පරික විශ්වාස අනුව උපුල්වන් දෙවියන්ට භාර කාර්යයක් වූ ලංකාව ආරක්ෂා කිරීම නාථ දෙවිඳුන්ට පැවරීමයි (එම, පද්‍ය.230). නාථ දෙවියන් සමඟ ශිව දෙවියන් පිළිබඳ ව සඳහන් වන අවස්ථා මෙම කාව්‍ය සංග්‍රහයේ දක්නට ලැබේ. රාහුල හිමියන් වැඩ වසන පිරිවෙන් භූමිය කුවේරයාගේ පිරිවෙන් භූමිය මෙන් බබළන ආකාරයට නාථ දෙවියන්ගේ ආලෝකයෙන් පිරිවෙන් භූමිය ආලෝකවත් වන බව ගිරාවේ දැක්වේ (එම, පද්‍ය.11). මෙහි දැක්වෙන අන්දමට නාථ අනෙකුත් සිංහල දෙවි දේවතාවුන්ට වඩා ඉහළ තත්ත්වයකට පත්ව බුද්ධිමත්ව වඩාත් ආසන්නව වසන දෙවියකු ලෙස විස්තර කොට තිබේ (එම, පද්‍ය.128). මේ අයුරින් මෙම සංදේශය තුළ නාථ දෙවියන් ගැන හෙළි කරන තොරතුරු ඇසුරෙන් රාජ්‍ය පිළිබඳ මහායාන බෝධිසත්ව සංකල්පය ඒකාබද්ධ කර ගන්නා ආකාරය අවබෝධ කරගත හැකිය (ධර්මදාස, සහ තුන්දේනිය, 1994:85). තවද කෝට්ටේ යුගය වන විට හින්දු බ්‍රාහ්මණ සම්ප්‍රදාය ද බෞද්ධ සංස්කෘතිය කෙරෙහි තදින් බලපෑ බව මෙමගින් අවබෝධ කර ගත හැකිය.

සංදේශ කාව්‍ය අතර ඉතා වැදගත් කෘතියක් වන කෝකිල සංදේශයේ ද නාථ දෙවිඳුන් ගැන සඳහන් වේ. මෙහි කතුවරයා දූතයාට උපදෙස් දෙන්නේ මාතර සිට මිහිරිපැන්නට ගමන් ගනිද්දී තුම්මෝදර වැල්ලේ ඇති නාථ දේවාලයෙහි ලැගුම් ගන්නා ලෙස ය (ගුණවර්ධන, 1962:89). නාථ දෙවියන් ගැන මෙම සංදේශයෙහි පහත අයුරින් වර්ණනා කර ඇති බවය.

මුනිවිරු වෙතම මෙම මනරම් ලෙස පිහිටි
තනතුරු කෙලෙස ගිර මෙන් සඳ කැන් දැවටී
විසිතුරු රුවින් යුතු මතු බුදු වන්නට සිටී
තනිසුරු නමඳු සිදුවන ලෙස නසිට අටී

(එම,පද්‍ය.89)

කෝකිල සංදේශය පවසන්නේ නාථ ප්‍රතිමාව තොටගමුව විහාරයේ බුද්ධ ප්‍රතිමාවට සමීප ව ඉදි කර ඇති බවයි. එසේ තැන්පත් කර ඇති ප්‍රතිමාව සඳ එළියෙන් වැසී ගිය පර්වතයක් මෙන් සුදුපාට බව ප්‍රකාශ කරයි. නාථ දෙවිඳුන් මෙහි දී වර්ණනා කර ඇත්තේ පෙනුමෙන් සුරූපී හා අනාගත බුදුවරයකු වශයෙනි. මෙම සංදේශයේ උතුරු ප්‍රදේශයේ වල්විල ප්‍රදේශයට ආසන්න ව පැවති, නාථ දේවාලයන් ගැන සඳහන් වුවත් එම ප්‍රදේශයෙහි නාථ දේවාලයක් පිළිබඳ පුරාවිද්‍යාත්මක සාක්ෂි නොමැති බව නන්දසේන මුදියන්සේ ප්‍රකාශ කරයි (Mudiyanse, 1976,12).

මේ හැර පරෙවි සංදේශයේ ශ්‍රී රාහුල හිමි නාථ දකින්නේ දෙවියකු ආකාරයෙන් බව සඳහන් වේ (සුනන්ද,1925:76). රාහුල හිමියන් නාථ වන්දනයෙහි උග්‍ර භක්තිවන්තයකු වූ නිසා තම පරෙවි සංදේශයෙහි නාථ දෙවිඳුන් හඳුන්වන්නේ "දිවයුරුසිය"(සූරියබන්ධු) ලෙසය (එම). මෙම සංදේශ හා සමකාලීන සෙසු සාහිත්‍ය කෘතීන් බෝධිසත්වයන් ඉතා උසස් ලෙස වර්ණනා කර ඇති බැවින් කවියා ඔහු හැඳිනගැනීමට සූර්යයා යැයි රූපකයක් යොදන්නට ඇත. රාහුල හිමියන්ගේ තවත් කෘතියක් වන ***කාව්‍යශේඛරය*** තුළ නාථ දෙවිඳුන් හඳුන්වන්නේ අනාගතයේ දී බුදු වන නාථ දෙවිඳු තේජසින් සූර්යයාටත්, සෞම්‍ය ගුණයෙන් චන්ද්‍රයාටත් සමාන බවයි (ධර්මාරාම, 1953:24). නාථ දෙවියන් ගැන ඉතා වැදගත් වර්ණනාවක් දක්නට ලැබෙන්නේ රාහුල හිමියන්ගේ ශිෂ්‍යයකු වශයෙන් සැලකෙන ශ්‍රී රාමචන්ද්‍ර කවි භාරතී නම් බ්‍රාහ්මණයා තොටගමුවට පැමිණ අධ්‍යාපනය ලබා වෘත්තරත්නාකාර නම් ඡන්දස් ග්‍රන්ථයට පංචිකාවක් සපයමින් අවලෝකිතේශ්වර ගැන සඳහන් කරන අවස්ථාවේ ය. ඔහු උග්‍ර නාථ භක්තිමතෙකු බව සිතිය හැකිය. නමුත් තම ගුරුවරයා නාථ වන්දනයෙහි නිරත වූ බැවින් ඔහු ද එමග ගිය බව සිතිය හැකි ය.

## නිගමනය

අප මෙතෙක් අවධානයට ලක් කළ කරුණු තුළින් අවබෝධ වන්නේ ගම්පොල සහ කෝට්ටේ යුගයේ රචනා වූ සංදේශ තුළින් නාථ දෙවියන්ගේ ලෞකික හා ලෝකෝත්තර ගති ලක්ෂණ දෙක ම වර්ණනාවට බඳුන් වූ බවයි. නාථ බලගතු දෙවියෙකු ලෙස එම යුගයේ හිමිවූ වැදගත්කම වඩාත් තහවුරු වේ. මෙම සංදේශ සාහිත්‍ය තුළින් නිර්මාණය වූ සංකල්ප පසුකාලීන ව උඩරට ජන සමාජය තුළ නාථ දෙවියන්ට සුවිශේෂි තැනක් හිමිවීමට හේතු වූ බව පෙනේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

***කාව්‍යශේඛරය,*** (1953), සංස්. ශ්‍රී ධර්මාරාම, කැලණිය,

***කව්සිළුමිණ,*** (1964), සංස්. අලව් ඉසි සැම්හෙළ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹත.

***තිසර සංදේශය***, (1936), දීපනී, සංස්. කුමාරතුංග මුනිදාස, සූරිය මුද්‍රණ, කොළඹ.

***මයුර සංදේශ කාව්‍ය වර්ණනාව***, (1949), සංස්. ඩබ්ලියු. ඇෆ්. ගුණවර්ධන, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

***රාජරත්නාකරණය***, (1929), සංස්. පී.එන්. තිසේරා, කොළඹ.

***පරවි සන්දේශය***, (1925). සංස්. සිරි සුනන්ද, මාතර.

ඉංලගසිංහ, මංගල, (2005), ***මධ්‍යකාලීන ලංකාවේ ආගම***, එස්.ගොඩගේ සහ සමාගම, කොළඹ.

කාරියවසම්, තිස්ස, (1991), ***සිරිලක දෙවිවරු***, හියු නෙවිල් එකතුව ආශ්‍රයෙනි, තරංජි ප්‍රින්ටස්,කොළඹ.

ජයවර්ධන, කුසුම්සිරි, (2009), ***මහනුවර ලෝක උරුම නගරයේ ස්මාරක***, දයාවංශ ජයකොඩි සහ සමාගම, කොළඹ,

තුන්දෙණිය එච්.එම්.එස්. (2002), ***ගම්පොල යුගයේ දේශපාලන ක්‍රියාකාරිත්වය***, තරංජි ප්‍රින්ට්ස්, මහරගම.

දිසානායක, සෙනරත්, (2005), ***ප්‍රාග් බෞද්ධ ලංකාවේ දෙව් දේවතාවෝ***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය එච්.එම්.එස්. (1994), ***සිංහල දේව පුරාණය***, මුද්‍රණ නිතිගත සංස්ථාව, පාදුක්ක.

පරණවිතාන, සෙනරත්, (1963), ***ශ්‍රී ලංකාවේ ස්තූප***, පරි. ඇල්. ප්‍රේමතිලක, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ.

වික්‍රමගේ, චන්ද්‍රා, (1991), ***ශ්‍රී ලංකා බෝධිසත්ව සංකල්පය***, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

හොල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, (1994), ***මකුට මුනිධාරි අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය***, පරි. පී.බී. මීගස්කුඹුර, ප්‍රදීප ප්‍රකාශන, කොළඹ.

හේරත්, යමුනා, (2003), ***ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්***, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, කොළඹ.

***Epigraphia Zeylanika***, (1948) ed. Senerath Paranavithana, Vol.iv Oxford University Press, London.

Mudiyanse, N. (1976) ***Mahayana Monuments in Ceylon***, Gunasiri, Colombo.

Mudiyanse, N**. (1967)** ***Art and Architecture of the Gampola Periods***, Gunesena, Colombo.